# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,163 - 2020 පෙබරවාරි මස 14 වැනි සිකුරාදා - 2020.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 260 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 269 |


*සැ. යු.*-(i) මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත 2020 පෙබරවාරි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2020 පෙබරවාරි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 මාර්තු මස 06 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 පෙබරවාරි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


257 - B 82007— 5,403 (2020/02)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයින් සඳහා නීති සහ උපදෙස්

1976 අංක 19න් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ විධිවිධානයන්ට සහ වරින්වර පනවනු ලබන නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට සියලු විභාග අපේක්ෂකයින් බැඳී ඇත.

1976 අංක 19 සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 20 වගන්තිය මගින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත කොන්දේසි හා සීමා කිරීම් නියම කරනු ලැබේ.

සියලු විභාග අපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු අතර මෙම නීති කිසිවක් උල්ලංඝනය කරන විභාග අපේක්ෂකයකුට විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි පහත දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකි ය.

(i) විමර්ශනයට භාජනය වූ මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම
(ii) විමර්ශනයට භාජනය වූ විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම
(iii) මුළු ජීවිත කාලයටම විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සියලු විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(iv) නිශ්චිත කාලවකවානුවක් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(v) අත්හිටවූ විභාග තහනමක් සහිතව ලිපියක් නිකුත් කිරීම
(vi) සහතික පත්‍රය යම්කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම
(vii) ප්‍රසිද්ධ විභාග පනත යටතේ අපරාධ නඩුවක් පැවරීම සඳහා විභාග අපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ එම ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම
(viii) විභාග අපේක්ෂකයා රජයේ සේවකයකු වන අවස්ථාවකදී විභාග අපේක්ෂකයාගේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් අදාළ විභාග අපේක්ෂකයාගේ පත්වීම් බලධාරියා වෙත (විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා) වාර්තා කිරීම

විභාගයට පෙර හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ මොනයම් අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

1. සියලුම විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී සහ විභාග පරිශ්‍රය තුළදී විභාග ශාලාධිපතිට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද අනෙකුත් විභාග අපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස හැසිරිය යුතුය. එසේම, විභාග අපේක්ෂකයන් විභාග පරිශ්‍රයේ දේපළවලට හෝ විභාග කාර්ය මණ්ඩලයේ පෞද්ගලික දේපලවලට කිසිදු අන්දමකින් හෝ අලාභ හානි නොකළ යුතු ය.

2. විභාග අපේක්ෂකයින් විභාගය පවත්වාගෙන යන කාලසීමාව තුළදීත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතිගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම ආරම්භ කර පැය භාගයක් ගත වූවාට පසු කිසිදු විභාග අපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කර ගනු නොලැබේ. විභාගය අවසන් වන තුරු ද කිසිම අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටව යාමට ඉඩ ලබා දෙනු නොලැබේ. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට නියමිත වේලාවට සහභාගී වීමට කටයුතු කළ යුතු ය.

4. සෑම විභාග අපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුය. තමන්ට නියම කරන ලද අසුන හැර වෙනත් තැනක අසුන් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදු වේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතා බහ කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම සම්පූර්ණයෙන් ම තහනම් වේ.

6. විභාග අපේක්ෂකයකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ අපේක්ෂකයාගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම ලිවීම, උත්තර පත්‍රය හඳුනාගත හැකි වන අයුරින් යම් සලකුණක් හෝ සටහනක් යෙදීම, උත්තර පත්‍රවල අසභ්‍ය හෝ අනවශ්‍ය දේ ලිවීම, උත්තර පත්‍ර සමග මුදල් නෝට්ටු ඇමිණීම සපුරා තහනම් වේ. අන්‍ය විභාග අපේක්ෂකයකුගේ විභාග අංකය තම උත්තර පත්‍රයේ ලිවීම ද වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංක ලියා ඇති උත්තර පත්‍ර ද ප්‍රතික්ෂේප කිරීම සිදු කෙරෙනු ඇත.

7. තමන් වෙත විභාග ශාලාවේදී සපයන කඩදාසි (විභාගය පැවැත්වෙන දිනයට අදාළව නිරීක්ෂකගේ කෙටි අත්සන හා දිනය යොදා ඇති පිළිතුරු ලිවීමේ කඩදාසි) හැර ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙනත් තැනක හෝ කිසිවක් නොලිවිය යුතු ය. මෙම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සලකනු ලැබේ.

8. විභාග අපේක්ෂකයින් වෙත සපයනු ලබන කඩදාසි හෝ පිළිතුරු ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම පැහැදිලිව කපා හැර උත්තර පත්‍රයට ඇමිණීම හෝ විභාගය අවසානයේ පිළිතුරු පත්‍ර සමග භාරදීම හෝ ලබා දෙන උපදෙස් පරිදි සිදු කළ යුතුය. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටතට ගෙනයාම තහනම් වේ. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක නැවත ලියවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතු ය.

9. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම් ය. මෙම සියලු ද්‍රව්‍යයන් විභාග කොමසාරිස් ජනරාල් සතුවන අතර මෙම නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා එක් එක් විභාගයේදී ළඟ තබා ගැනීමට ලිඛිතව අවසරදී ඇති ද්‍රව්‍යයන් හැර වෙනත් සටහන් පොත්, සටහන් ඇතුළත් කොළ හෝ කොළ කැබලි යනාදිය විභාග ශාලාව තුළ විභාගයට පෙනී සිටින අවස්ථාවේදී තමා සන්තකයේ හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතු ය. එසේම විභාග ශාලාව තුළ දී ජංගම දුරකථන, විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) තමා සන්තකයේ හෝ සමීපයෙහි තබා ගැනීම සහ එම උපකරණ / උපාංග භාවිතා කර බාහිර පාර්ශ්වයන්ගේ උදව් ලබා ගැනීම හා විභාගය පැවැත්වෙන අතරතුර වෙනත් පාර්ශ්ව හා සමාජ මාධ්‍ය වෙත තොරතුරු යැවීම වංචනික ක්‍රියාවක් සේම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.

11. විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග ඉහත 10 ඡේදයේ විස්තර කර ඇති කාර්යයන් සඳහා භාවිතා කර අසු වුවහොත් එම උපකරණ / උපාංග අදාළ විමර්ශන කටයුතු අවසන් වන තුරු විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. විභාග ශාලාවේ අසුන් ගැනීමෙන් පසු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී කිසිම විභාග අපේක්ෂකයකු ළඟ, විභාගය සඳහා ගෙන ඒමට අවසර ලබාදී නොමැති කිසිදු ද්‍රව්‍යයක් හෝ උපකරණයක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් ය. විභාග ශාලාධිපති හෝ කාර්ය මණ්ඩලය නියම කළහොත් සෑම අපේක්ෂකයකුම තම සන්තකයේ තිබෙන දෑ සහතික කිරීමට සහ පරීක්ෂා කිරීමකට යටත් වන අතර මෙම අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට උත්සහ දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. යම් අපේක්ෂකයකු වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ සංඥා මගින් හෝ වෙන කිසිවකින් හෝ කොපි කිරීම හෝ කොපි කිරීමට ප්‍රයත්න දැරීම හෝ වංචා සහගත ලෙස කටයුතු කිරීම වරදක් වන්නේ ය. වෙන අයදුම්කරුවකුට උදව් දීම ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ විභාග කාර්ය මණ්ඩලයෙන් හෝ උදව් ලබා ගැනීම ද වරදක් වන අතර උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසියට යටින් තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතු ය.

14. විභාගය ආරම්භ වී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් වැසිකිළි/කැසිකිළි යාමට අවශ්‍යතාවයක් උදෙසා විභාග අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටතට යන්නට වුවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර කාර්ය මණ්ඩලයේ නිලධාරියකුගේ සුපරීක්ෂාකාරිත්වය යටතේ අපේක්ෂකයාට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එලෙස පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු/ඇය සෝදිසියකට භාජනය විය යුතු ය.

15. විභාග ශාලාවේ පිළිතුරු ලිවීමට පටන් ගැනීමට පෙර හෝ පසුව නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් වන්නේය. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ ව්‍යාජ අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීම වංචනික ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

16.විභාග අපේක්ෂකයකු හෝ විභාග අපේක්ෂකයකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

17. විභාග අපේක්ෂකයන් පහත උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය. ඃ

(i) සෑම විභාග අපේක්ෂකයෙකුම තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කර ගැනීමත්, ඉල්ලුම් කරන ලද විෂයයන් හා ප්‍රවේශ පත්‍රයේ සඳහන් විෂයයන් අතර නොගැලපීමක් පවතින්නේ නම් විභාග දෙපාර්තමේන්තුව විමසා විභාගයට පෙර සංශෝධනය කර ගැනීමත් සිදු කළ යුතු ය.

(ii) විභාගය පටන් ගැනීමට පැය බාගයකට (1/2) පෙර විභාග ශාලාව වෙත පැමිණීම සුදුසු වන අතර විභාග ශාලාව නිශ්චිතව නොදන්නා විට විභාගය පටන් ගන්නා දිනට කලින් ඒ පිළිබඳ සොයා බලා නියම ස්ථානය නිශ්චිතව හඳුනා ගැනීම යෝග්‍ය වේ.

(iii) විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍රය ඉදිරිපත් කර තම අනන්‍යතාව තහවුරු කළයුතු ය.

(අ). අනන්‍යතාව ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරන අතර, යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ පිළිබඳ විභාග ශාලාධිපති දැනුවත් කර විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීම කටයුතු කළයුතු ය.

(ආ). සෑම අපේක්ෂකයකුම තම අනන්‍යතාව පැහැදිලිව පෙනෙන ලෙස සම්පූර්ණ මුහුණ හොඳින් හඳුනාගත හැකිවන අයුරින් විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ විභාග ශාලාවේ රැඳී සිටිය යුතු ය.

(iv) විභාග අපේක්ෂකයන් බ්ලූටූත් වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) භාවිතා නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී තම දෙකන විවෘතව පැහැදිලිව පෙනෙන ලෙස තබාගත යුතු ය.

(v) විභාග ශාලාවේදී ඔබට ලබා දෙනු ලබන කඩදාසි හැර වෙන මොන ම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුය. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ මේසය මත තබා යා යුතු ය.

(vi) විභාග අපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, මකන, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතු ය.

(vii) තමන් භාවිතා කරන පිළිතුරු ලිවීමේ පොත සහ සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද, පිරිසිදුව ද උත්තර ලිවිය යුතු ය. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු එම ප්‍රශ්නයේ ම අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක් රූලක්වත් හිස්ව තිබිය යුතුය. සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

(viii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුය. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක නිවැරදිව යෙදීමට කටයුතු කළ යුතු ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද, සෑහෙන පමණ විශාලව ද තිබිය යුතු ය.

(x) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් සඳහන් කර ඇති උපදෙස් හොඳින් කියවා බැලිය යුතුය. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුව පිළිතුරු ලබාදී නොමැති අවස්ථාවලදී ලකුණු ලබා දීම සිදු කරනු නොලැබේ.

(xi) එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද පොතට අමතරව ලියන කඩදාසි පිටු අංක පිළිවෙළ අනුව එකතුකර වම් පැත්තේ ඉහළ කෙළවරේ නොගැලවෙන සේ ගැටගැසීම / ඇමිණීම කළයුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර සියලුම පිළිතුරු ලියූ කොළ අමුණා තිබේද යන්න තහවුරු කරගත යුතුය. පිළිතුරු පත්‍ර භාරදුන් පසුව විභාග මධ්‍යස්ථානයෙන් බැහැරට ගෙන ගිය කිසිදු පිළිතුරු ලියූ කඩදාසියක් ඇගයීමට ලක් කරනු නොලැබේ.

(xii) ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්යය මණ්ඩලයේ නිලධාරියකුට භාරදිය යුතුය. උත්තර පත්‍ර එකතු කරන තුරු ඔබගේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම්විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකි ය.

(xiii) යම් කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට කථා කිරීමට අවශ්‍ය වූ විට අන් අයට බාධාවක් නොවන සේ දෙවරක් මේසයට තට්ටු කිරීමෙන් සංඥා කළ යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා පොලීසිය

### පොලිස් කොස්තාපල් තනතුර

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික පොලිස් කොස්තාපල් තනතුර සඳහා පහත පළාත්වල පවතින පුරප්පාඩු පිරවීමට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| පළාත | පුරප්පාඩු ගණන | පළාත | පුරප්පාඩු ගණන |
|---|---|---|---|
| ❖උතුරු පළාත | 1400 | ❖මධ්‍යම පළාත | 461 |
| ❖දකුණු පළාත | 377 | ❖ඌව පළාත | 335 |
| ❖නැගෙනහිර පළාත | 545 | ❖වයඹ පළාත | 419 |
| ❖උතුරු මැද පළාත | 461 | ❖බස්නාහිර පළාත | 1340 |
| ❖සබරගමුව පළාත | 251 | | |

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් ''අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06,'' යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2020.03.24 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලිසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,54,480 - 7 x 3,600 - 27 x 4,440 - රු. 4,99,560.00

මෙම වැටුප් ගණනය කිරීම රා. ප. ච. 03/2016 අනුව සිදුකර ඇත.

තව ද මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබාදී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | රු. ශත |
|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | 7,800 0 |
| (ආ) | රා.ප.ච.03/2016 අනුව තනතුරට අදාළ 40% දීමනාව | 11,816 0 |
| (ඇ) | දුෂ්කර දීමනාව | 2,000 0 |
| (ඈ) | අන්තර් දීමනාව | 2,500 0 |
| (ඉ) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | 250 0 |
| (ඊ) | සංයුක්ත දීමනා (විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා උපරිමය) | 10,500 0 |
| (උ) | සංයුක්ත දීමනා (විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා උපරිමය) | රු. 9,800 0 |

මෙම දීමනාවලට අමතරව :

(අ) නොමිලේ ගමන් පහසුකම්,

(ආ) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුව ද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)

(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(අ) *වයස් සීමාව* :

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-28 ත් අතර විය යුතු ය. එසේ වුව ද දැනට ශ්‍රී ලංකා පොලිසියේ රාජකාරියේ නියුතු පොලිස් කොස්තාපල් රියදුරන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම්කළ හැකිය.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්* :

අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකක දී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේ දී විෂයයන් 05ක් සමත් විය යුතුය. (විෂයන් 05 ඇතුළත ගණිතය හෝ මාධ්‍ය භාෂාව යන විෂයයන් දෙකම හෝ ඉන් එකක් හෝ සමත් විය යුතුය.)

**සටහන 01:** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41, 44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් ලෙස ද, සලකා විභාග-යෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

**සටහන 02 :** අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

**සටහන 03:** වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා. පෙළ.)

විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) *ශාරීරික සුදුසුකම්* :

- උස අඩි 05 අඟල් 04 (අවම),
- පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා).

*සටහන* : එසේ වුවද අනෙකුත් සුදුසු සපුරා ඇති අයදුම්කරුවන් උස අඩි 05 අඟල් 02ක් හෝ ඊට වැඩිනම් පවතින පුරප්පාඩු මත බඳවාගැනීම සඳහා පොලිස්පති විසින් සලකා බැලිය හැක.

විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා මූලික සුදුසුකම් ලබයි.

(ඈ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් .—* එක් ඇසක දෘෂ්ටිය 6/12ට අඩු නොවිය යුතු ය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේනම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතු ය. යම් අයදුම්කරුවෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඉ) *අනෙකුත් සුදුසුකම්* :

අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කරන පොලිස් කොස්තාපල් රියැදුරන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :-

- ❖ අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා පොලිසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණය සමත් විය යුතු ය.

  මීටර් 1000 - මිනිත්තු 03 තත්පර 44

- ❖ යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

- වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය ඃ කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතු ය.
- සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය ඃ කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය* :

අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය සඳහා ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණය පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරියා විසින් වෛද්‍ය පරීක්ෂණයේ වාර්තා සංඛ්‍යා 169 පෝරමය යටතේ ඉදිරිපත් කරන අතර වෛද්‍ය පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැක්කේ එක් වරක් පමණි.

07. *පසුබිම් පරීක්ෂණය* :

(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම හා තොරතුරු වසන් කිරීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව හා තොරතුරු වසන් කළ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. පුහුණුව

බඳවා ගනු ලබන අයදුම්කරුවන් ඔවුන්ගේ පදිංචි ප්‍රදේශය අයත්වන පුහුණු පාසැල්වල පුහුණුව සඳහා හැකිතාක්දුරට යොමු කරනු ලබන අතර, පුහුණුවෙන් පසු එම ප්‍රදේශවල පවතින පුරප්පාඩු මත සේවයේ අවශ්‍යතාවය අනුව අනුයුක්ත කිරීම සඳහා ද කටයුතු කරනු ලැබේ.

09. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :

- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.
- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ

තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

10. *පත්වීමේ කොන්දේසි* :

මෙම පත්වීම ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

11. *සේවා කොන්දේසි* :

(*අ*) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(*ආ*) බඳවා ගනු ලබන නිලධාරීන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(*ඇ*) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙළුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, පොලිස් නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(*ඈ*) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙක්ම ශ්‍රී ලංකා පොලිසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(*ඉ*) පත්කර ගනු ලැබූ නිලධාරීන්ට පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(*ඊ*) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කළ යුතු වන අතර මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළකිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙළුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(*උ*) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.

(*ඌ*) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(*එ*) ආධුනික පොලිස් කොස්තාපල්වරුන් සේවය ස්ථිර කිරීමෙන් පසු ශ්‍රී ලංකා පොලිසියේ අනුමත උසස් කිරීමේ පටිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

12. (*අ*) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළකරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(*ආ*) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

13. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ලේඛන ඉදිරිපත් නොකළ යුතුය.) :-

(*අ*) උප්පැන්න සහතිකය,

(*ආ*) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),

(*ඇ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(*ඈ*) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(*ඉ*) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),

(*ඊ*) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

14. (*අ*) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතුය.

(*ආ*) අයදුම්කරු විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

15. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

සැලකිය යුතුයි.-2020.01.24 දිනැති අංක 2160 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්පත්‍ර* හි I වැනි කොටස : (IIඅ) වැනි ඡේදයේ පලකරන ලද දැන්වීම අනුව අයදුම්පත් ඉදිරිපත් කළ අපේක්ෂකයන් නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

*සටහන.*— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලිසිය විසින් ගෙවනු නොලැබේ.

සී. ඩී. වික්‍රමරත්න,
*වැඩ බලන* පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා 2'' x 2 1/2'' |
|---|

**ශ්‍රී ලංකා පොලීසිය**

**ආධුනික පොලිස් කොස්තාපල් තනතුර**

ආදර්ශ අයදුම්පත්‍රය

01. (*අ*) සම්පූර්ණ නම :————.
(පැහැදිලි ලොකු අකුරෙන්) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පතේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.

(*ආ*) නම (මුලකුරු සමග) :————.

(*ඇ*) අයදුම් කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :————.

04. අයදුම්කරු උපන් ස්ථානය :————.

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————. පළාත :————.

05. (*අ*) වර්තමාන ලිපිනය :————.
(*ආ*) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(*ඇ*) ස්ථිර ලිපිනය :————.
(*ඈ*) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(*ඉ*) ලිපි හුවමාරු කළයුතු ලිපිනය :————.
(*ඊ*) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.

(*උ*) දුරකථන අංකය : නිවස :————. ජංගම :————.

06. (*අ*) ජන වර්ගය :————.
(*ආ*) ඔබ ශ්‍රී ලංකා පුරවැසියකු වූයේ පරම්පරාවෙන් ද ? *නැතහොත්* ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(*ඇ*) ඔබ පුරවැසියකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.
* අයදුම්කරු :————.
* අයදුම්කරුගේ පියා :————.
* අයදුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තා :————.
* අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.

07. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)

වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)

අවුරුදු :————, මාස :————, දින :————.

08. උස : අඩි :————. අඟල් :————.

පපුව : අඟල් :————.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :————.

10. අතිරේක සුදුසුකම් :————. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)

11. විවාහක/අවිවාහක බව :————.

12. (*අ*) දැනට කරන රැකියාව :————.
(*ආ*) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද ? :————.

14. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :

(*අ*) ————.
(*ආ*) ————.

15. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලීසියේ සේවය කර තිබේ ද ? :————.

තනතුර සහ නිල අංකය :————.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :————.

16. (*අ*) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :———.

18. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇත්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

20. ආයතන ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................... මයා ..................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයකු බවත් ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
ආයතන ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර :———.

දිනය :———.

02-551/1

## ශ්‍රී ලංකා පොලීසිය

### කාන්තා පොලිස් කොස්තාපල් තනතුර

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර සඳහා පහත පළාත්වල පවතින පුරප්පාඩු පිරවීමට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| පළාත | පුරප්පාඩු ගණන | පළාත | පුරප්පාඩු ගණන |
|---|---|---|---|
| ❖උතුරු පළාත | 400 | ❖මධ්‍යම පළාත | 217 |
| ❖දකුණු පළාත | 201 | ❖ඌව පළාත | 139 |
| ❖නැගෙනහිර පළාත | 124 | ❖වයඹ පළාත | 217 |
| ❖උතුරු මැද පළාත | 170 | ❖බස්නාහිර පළාත | 309 |
| ❖සබරගමුව පළාත | 170 | | |

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් ''අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06,'' යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2020.03.24 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලිසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,54,480 - 7 x 3,600 - 27 x 4,440 - රු. 4,99,560.00

මෙම වැටුප් ගණනය කිරීම රා. ප. ච. 03/2016 අනුව සිදුකර ඇත.

තව ද මෙම නිලධාරිනියන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබාදී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | රු. | ශත |
|---|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | 7,800 | 0 |
| (ආ) | රා.ප.ච.03/2016 අනුව තනතුරට අදාළ 40% දීමනාව | 11,816 | 0 |
| (ඇ) | දුෂ්කර දීමනාව | 2,000 | 0 |
| (ඈ) | අන්තර් දීමනාව | 2,500 | 0 |
| (ඉ) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | 250 | 0 |
| (ඊ) | සංයුක්ත දීමනා (විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා උපරිමය) | 10,500 | 0 |
| (උ) | සංයුක්ත දීමනා (විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා උපරිමය) | 9,800 | 0 |

මෙම දීමනාවලට අමතරව :

(අ) නොමිලේ ගමන් පහසුකම්,

(ආ) නිලධාරිනියන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුව ද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)

(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(අ) *වයස් සීමාව* :

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-28 ත් අතර විය යුතු ය.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්* :

- අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකක දී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේ දී විෂයයන් 05ක් සමත් විය යුතුය. (විෂයන් 05 ඇතුළත ගණිතය හෝ මාධ්‍ය භාෂාව යන විෂයයන් දෙකම හෝ ඉන් එකක් හෝ සමත් විය යුතුය.)

**සටහන 01:** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් ලෙස ද, සලකා විභාග යෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

**සටහන 02 :** අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

**සටහන 03:** වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) *ශාරීරික සුදුසුකම්* :

- උස අඩි 05 යි. අඟල් 02 යි. (අවම),

*සටහන* : එසේ වුවද අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අයදුම්කාරිය උස අඩි 05 ක් හෝ ඊට වැඩිනම් පවතින පුරප්පාඩු මත බඳවාගැනීම සඳහා පොලිස්පති විසින් සලකා බැලිය හැක.

විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කාරියකගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා මූලික සුදුසුකම් ලබයි.

(ඈ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් .—* එක් ඇසක දෘෂ්ටිය 6/12ට අඩු නොවිය යුතු ය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේනම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතු ය. යම් අයදුම්කාරියෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඉ) *අනෙකුත් සුදුසුකම්* :

අයදුම්කාරිය අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ.)

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

❖ අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කාරියන් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණය සමත් විය යුතු ය.

මීටර් 1000 - මිනිත්තු 05 තත්පර 14

- යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කාරියන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කාරියන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

- ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

  - වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය : කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතු ය.

  - සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය : කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය* :

අයදුම්කාරියන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්

වූ අයදුම්කාරියන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය, සඳහා ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වුවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණය පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරියා විසින් වෛද්‍ය පරීක්ෂණයේ වාර්තා සෞඛ්‍ය 169 පෝරමය යටතේ ඉදිරිපත් කරන අතර වෛද්‍ය පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැක්කේ එක් වරක් පමණි.

07. *පසුබිම් පරීක්ෂණය* :

(*අ*) අයදුම්කාරියගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඇය හා ඇයගේ සමීප ඥාතීන්ගේ ද, ඇය ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කාරියන් බඳවා ගනු නොලැබේ.

(*ආ*) බඳවා ගැනීමේ දී අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම හා තොරතුරු වසන් කිරීම ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව හා තොරතුරු වසන් කළ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *පුහුණුව* :

බඳවාගනු ලබන අයදුම්කාරියන් ඔවුන්ගේ පදිංචි ප්‍රදේශය අයත්වන පුහුණු පාසැල්වල පුහුණුව සඳහා හැකිතාක් දුරට යොමු කරනු ලබන අතර, පුහුණුවෙන් පසු එම ප්‍රදේශවල පවතින පුරප්පාඩු මත සේවයේ අවශ්‍යතාවය අනුව අනුයුක්ත කිරීම සඳහා ද කටයුතු කරනු ලැබේ.

09. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :

- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත්කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවාගනු ලබන සියලුම නිලධාරිනියන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.

- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ තනතුරු දරන නිලධාරිනියන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරිනියන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

10. *පත්වීමේ කොන්දේසි* :

මෙම පත්වීම ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

11. *සේවා කොන්දේසි* :

(*අ*) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(*ආ*) බඳවා ගනු ලබන නිලධාරිනියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(*ඇ*) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙළුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, පොලිස් නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(*ඈ*) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරිනියක්ම ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. එම පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරී කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(*ඉ*) පත්කර ගනු ලැබූ නිලධාරිනියන්ට පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතුන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(*ඊ*) අයදුම්කාරියන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලීසියේ සේවය කළ යුතු වන අතර මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඇයගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළකිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙළුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(*උ*) ආධුනික කාන්තා පොලිස් කොස්තාපල්වරියන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.

(*ඌ*) ආධුනික පොලිස් කොස්තාපල්වරියන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව

අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික කාන්තා පොලිස් කොස්තාපල්වරියන් සේවය ස්ථිර කිරීමෙන් පසු ශ්‍රී ලංකා පොලීසියේ අනුමත උසස් කිරීමේ පටිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

12. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළකරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

13. අයදුම්කාරියන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ලේඛන ඉදිරිපත් නොකළ යුතුය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

14. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කාරිය තෝරා ගන්නා ලද්දේ නම් ඇය නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතුය.

(ආ) අයදුම්කාරිය විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

15. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කාරියන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

***සැලකිය යුතුයි.***-2020.01.24 දිනැති අංක 2160 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙ* හි I වැනි කොටස : (IIඅ) වැනි ඡේදයේ පළකරන ලද දැන්වීම අනුව අයදුම්පත් ඉදිරිපත් කළ අපේක්ෂිකාවන් නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

*සටහන.*— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.

සී. ඩී. වික්‍රමරත්න,
*වැඩ බලන* පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

| |
|---|
| **කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා** |
| **2'' x 2 1/2''** |

**ශ්‍රී ලංකා පොලීසිය**

**ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර**

ආදර්ශ අයදුම්පත්‍රය

01. (අ) සම්පූර්ණ නම :———.
(පැහැදිලි ලොකු අකුරෙන්) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පතේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.

(ආ) නම (මුලකුරු සමග) :———.

(ඇ) අයදුම් කරන තනතුර :———.

02. ජාතික හැඳුනුම්පත් අංකය :———.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :———.

04. අයදුම්කාරිය උපන් ස්ථානය :———.

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———. පළාත :———.

05. (අ) වර්තමාන ලිපිනය :———.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඇ) ස්ථිර ලිපිනය :———.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඉ) ලිපි හුවමාරු කළයුතු ලිපිනය :———.
(ඊ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසම :———.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.
(උ) දුරකථන අංකය : නිවස :———. ජංගම :———.

06. (අ) ජන වර්ගය :———.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? *නැතහොත්* ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.

* අයදුම්කාරිය :————.
* අයදුම්කාරියගේ පියා :————.
* අයදුම්කාරියගේ පිය පාර්ශවයේ මුත්තා :————.
* අයදුම්කාරියගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.

07. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)

වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)

අවුරුදු :————. මාස :————. දින :————.

08. උස : අඩි :————. අඟල් :————.

පපුව : අඟල් :————.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :————.

10. අතිරේක සුදුසුකම් :————. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)

11. විවාහක/අවිවාහක බව :————.

12. (අ) දැනට කරන රැකියාව :————.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද ? :————.

14. අයදුම්කාරිය ගැන විමසුම් කළ හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :

(අ) ————.
(ආ) ————.

15. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලීසියේ සේවය කර තිබේ ද ? :————.

තනතුර සහ නිල අංකය :————.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :————.

16. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :————.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :————.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :————.

18. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :————.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇත්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

————,
අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

20. ආයතන ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ……………………… මිය/මෙනවිය ………………… දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත්, ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර :————.

දිනය :————.

02-551/2

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

සංශෝධනයයි

**අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාව සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යාංශය මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව**

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ III ශ්‍රේණියේ මිනුම් විද්‍යා පරීක්ෂණ නිලධාරි (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහාවන බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020

2020.01.31 දින පළ කරන ලද අංක 2161 *ගැසට්* පත්‍රයේ නිවේදන අංක 01-790 හි අංක 09 පහත පරිදි සංශෝධනය විය යුතු ය. :-

''රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුතු උක්ත තනතුර සඳහා අයදුම් කරනු ලබන, සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගේ උපරිම වයස් සීමාව අවුරුදු 45 විය යුතු අතර, අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු වේ''.

එස්. එන්. අකුරන්තිලක,
මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ.

2020 පෙබරවාරි මස 06 වැනි දින.

02-460

---

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ කාර්මික නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඉහත තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2020 මැයි මාසයේ දී කොළඹ දිස්ත්‍රික්කයේ දී පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

විභාගය සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2020 මාර්තු 13 වේ.

1.0 *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1.1 රාජ්‍ය සේවයේ පත්කිරීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1589/30 දරන සහ 2009.02.20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසි සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය සඳහා වූ බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සහ ඒවාට දැනට කර ඇති හා මින් මතු කෙරෙන සංශෝධනවලටද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු මෙම තනතුරට පත් කරනු ලැබේ.

1.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට පත්වීම්ලාභියා යටත් විය යුතුවේ. තව ද පත්වීම්ලාභියා විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් වරින්වර නියම කරනු ලබන ආකාරයට පත්වීම්ලාභියා ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

1.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. පත්වීම්ලාභියා, ඔහු/ඇය බඳවා ගනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් ඇතුළත ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ සඳහන් පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

1.4 පත්වීම්ලාභියා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014ට අනුව තනතුරට පත් කරනු ලබන දින සිට වසර පහක්

ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

1.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත්වන හෝ මග හරින පත්වීම්ලාභියකුගේ පත්වීම අවලංගු කරනු ලැබිය හැකිය.

2.0 *මාසික වැටුප් පරිමාණය* :

අංක 03/2016 දරන හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 31,040-10x445-11x660-10x730-10x750-57,550 (MN-3-2016) වේ. 2020.01.01 දින දක්වා වැටුප් ගෙවීම එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව සිදුවේ. මෙයට අමතරව රජයේ නිලධාරීන්ට රජය විසින් කලින්කල ගෙවනු ලබන වෙනත් දීමනාද මෙම තනතුර දරන්නාට හිමිවනු ඇත.

3.0 බඳවා ගැනීමේ සුදුසුකම් :

3.1 සාමාන්‍ය සුදුසුකම්

3.1.1 ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.
3.1.2 විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
3.1.3 යම් ආගමික/ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු නොවිය යුතුය.
3.1.4 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල v වැනි පරිච්ඡේදයේ සඳහන් එකදු නුසුදුසුකමකින් හෝ පෙළෙන්නකු නොවිය යුතුය.
3.1.5 තනතුරට බඳවාගැනීමේ සුදුසුකම් සියල්ල මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇති අයකු විය යුතුය.

3.2 *වයස* :
අයදුම්පත් කැඳවීමේ අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2002.02.28 දිනට හෝ ඊට පෙර හා 1990.02.28 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

3.3 *අධ්‍යාපන සුදුසුකම්* :

3.3.1 සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථයන් සහිත එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

3.3.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා (ජෛවීය විද්‍යා)/ගණිත (භෞතීය විද්‍යා)/තාක්ෂණවේදය විෂයය ධාරාවට අයත් විෂයයන් තුනකින් එකවර සමත් වීම. (පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් හතරෙන් එකවර සමත් වී තිබීම.)

3.4 වෘත්තීය සුදුසුකම් :

3.4.1 මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) ;

හෝ

3.4.2 ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්) ;

හෝ

3.4.3 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්)

හෝ

3.4.4 අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්) ;

හෝ

3.4.5 ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වැනි කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම (සිවිල්);

හෝ

3.4.6 රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) VI මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

හෝ

3.6.7 උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ අධ්‍යාපන සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

3.5 *ශාරීරික හා මානසික යෝග්‍යතාව* :

ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුතු අයකු විය යුතුය.

4.0 විභාග ගාස්තු :

විභාගය සඳහා වූ ගාස්තුව රු. 600 කි. එය අයදුම්පත් භාරගන්නා දිනට පළමුව දිවයිනේ ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13ට බැර කිරීම සඳහා ගෙවිය යුතුය. මෙම ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ.

5.0 අයදුම්කිරීමේ ක්‍රමය :

5.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව ඒ 4 කඩදාසියේ දෙපැත්ත භාවිතා කරමින් 01 සිට 05 දක්වා ශීර්ෂ පළමු පිටුවේද 06 සිට 13 දක්වා ශීර්ෂ සෙසු පිටුවලද වන පරිදි පරිගණකයෙන් සකස් කර ගනු ලබන හෝ යතුරු ලියනය කරන ලද අයදුම්පතක් අපේක්ෂකයාගේ අත්අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු අතුළත් කර ඇති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පතේ ඡායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. සම්පූර්ණ කරන ලද අයදුම්පත විභාග නිවේදනයේ දැක්වෙන ආකෘතියට අනුකූලද යන්න අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුණහොත් අයදුම්පත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප විය හැකිය

5.2 අයදුම්පත අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම විය යුතුය.

5.3 සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාර ගැනීමේ අවසාන දින හෝ ඊට පෙර ලැබෙනු පිණිස;

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
තැ. පෙ. 1503
කොළඹ

යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ ''ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2019'' යන වචන පැහැදිලිව සඳහන් කළ යුතුය. මෙදිනට පසු ලැබෙන කිසිම අයදුම්පතක් භාරගනු නොලැබේ. සිංහල හෝ දෙමළ භාෂාවෙන් අයදුම්පත සකස් කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදීම අත්‍යවශ්‍යය.

5.4 අයදුම්පතෙහි අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතීඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

5.5 සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

5.6 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පුවත්පත්වල හා දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක්, දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායී වනු ඇත. තවද විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළග තබා ගත් අයදුම්පතෙහි පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

6.0 විභාගයට ඇතුළු වීම :

6.1 සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාග යට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

6.2 අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවාගෙන

පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අපේක්ෂකයකුට අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රය ආරම්භයේ පළකර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

*සටහන*.-අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

7.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :

7.1 විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ. :

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළත් වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණ කිරීමෙන් තොරව සිටිය යුතුය.

8.0 සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණ වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කෙරේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

9.0 මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

10.0 විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :
විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

*සටහන* :

(i) අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
(ii) තම අයදුම් පතෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

11.0 බඳවා ගැනීමේ ක්‍රමය :

11.1 ලිඛිත විභාගය :
පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර දෙක (02) කින් යුතු ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් සහ එක් එක් විෂයය සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ. :

| *විෂයය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | පැය 1කි. | 100 | 40 |
| 02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 3කි. | 100 | 40 |

11.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

(i) ලිඛිත විභාගය සමත්වන අපේක්ෂකයින් අතුරින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලබන යම් කඩඉම් ලකුණකට ඉහළ මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගෙන ඇති අපේක්ෂකයින් ඉහත අංක 3 හි සඳහන් බඳවාගැනීමේ සුදුසුකම් සපුරා තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලැබේ.

11.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇති බවට තහවුරු කර ගනු ලබන ලිඛිත විභාගයේ ඉහළම ලකුණු ලබාගත් අපේක්ෂකයා/අපේක්ෂිකාව තනතුරට බඳවා ගනු ලැබේ.

11.4 විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම් දීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය මගින් හෝ සිදු කරනු ලැබේ.

12.0 ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය :

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | අවබෝධ කර ගැනීමේ ශක්තිය, තර්කානුකූල විචාර බුද්ධිය, නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යානමය හා ගණිතමය ගැටලු විසඳීමේ හැකියාව භාෂා ඛණ්ඩ, වගු, පින්තූර, සටහන්, ප්‍රස්ථාර භාවිතය |
| 02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | මාන, සැලසුම් පිළිබඳ දැනුම, අත්තිවාරම්, පස් වර්ග, ගොඩනැගිලි ද්‍රව්‍ය, ගොඩනැගිලි ව්‍යුහය සහ නිමාව, ගොඩනැගිලි සැලසුම් මගින් ප්‍රමාණ ගැනීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, ජල සැපයුම් හා පල්දෝරු ක්‍රම |

13.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ පාඨ අතර අනනුකූලතාවක් ඇති විට සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.

ආචාර්ය අයි. ආර් බණ්ඩාර,
අධ්‍යක්ෂ ජනරාල්,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුව.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුව,
සංඛ්‍යාන මන්දිරය,
306/71,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය - ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ කාර්මික නිලධාරී තනතුර**

Supervisory Management Assistant (Technical) Service Category of the Department of Census and Statistics - Technical Officer Grade III Sri Lanka Technical Service

*தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களத்தின் மேற்பார்வை முகாமைத்துவ உதவியாளர் (தொழில்நுட்ப) சேவை வகுதி - இலங்கை தொழில்நுட்ப சேவையின் தரம் III*

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

01. විභාගයට පෙනී සිටින මාධ්‍ය :
2 - සිංහල
3 - දෙමළ
4 - ඉංග්‍රීසි
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

02. (i) සම්පූර්ණ නම :————.
(ii) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.
(iii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

03. ලිපිනය හා දුරකථන අංක :————.
(i) කාර්යාලීය ලිපිනය :————.

(ii) කාර්යාලීය දුරකථන අංකය : | | | | | | | | | | |

(iii) පෞද්ගලික ලිපිනය :————.

(iv) පෞද්ගලික දුරකථන අංකය : | | | | | | | | | | |

(v) ජංගම දුරකථන අංකය : | | | | | | | | | | |

(vi) විද්‍යුත් තැපැල :————.

04. ස්ත්‍රී පුරුෂභාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | | | |

06. (i) උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු | | | | | මාස | | | දින | | |

07. විවාහක/අවිවාහක බව :

අවිවාහක - 01

විවාහක - 02
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. (i) අ. පො. ස. (සා/ පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(ii) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය :————.
(iii) අයදුම්කරුගේ විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| ............ | ............ | ............ | ............ |
| ............ | ............ | ............ | ............ |
| ............ | ............ | ............ | ............ |
| ............ | ............ | ............ | ............ |
| ............ | ............ | ............ | ............ |
| ............ | ............ | ............ | ............ |

09. අ. පො. ස. (උ/ පෙළ) විභාගය පිළිබඳ විස්තර ඃ

(i) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය :————.

(ii) අයදුම්කරුගේ විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| ............ | ............ | ............ | ............ |
| ............ | ............ | ............ | ............ |
| ............ | ............ | ............ | ............ |

10. (i) නිවේදනයේ 3.4 ට අදාළ වෘත්තිය සුදුසුකම :————.

(ii) වෘත්තීය සුදුසුකම වලංගු වන දිනය :————.

11. විභාග ගාස්තු ඃ

රු. 600/- ක් වන විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න.
(රිසිට්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

12. අයදුම්කරුගේ ප්‍රකාශය ඃ

ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තවද මෙහි ඇතුළත් කිසියම් තොරතුරක් අසත්‍ය හා සාවද්‍ය බව සොයාගතහොත් එම සොයා ගැනීම තෝරා ගැනීමට පෙර සිදුවුවහොත් මා නුසුදුස්සකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසුව සොයා ගනු ලැබුවහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවයෙන් පහකිරීමට ලක් වන බව දනිමි. තවද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

13. අයදුම්කරුගේ / අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම ඃ

මෙම ඉල්ලුම්පත්‍රය ඉල්ලුම් කරන ........................................................................................... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ........................................................ දින ඔහුගේ / ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත්, මෙයින් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

දිනය :————.

රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා පමණි

මෙම ඉල්ලුම්කරු වන ........................ මහතා /මහත්මිය/මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ............................. වශයෙන් ස්ථිර/ තාවකාලික / අනියම් සේවකයෙකු / සේවිකාවක ලෙස සේවය කරන බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත් දන්වමි.

....................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

................................................

(නිල මුද්‍රාව)

තනතුර : ..........................................
දිනය : .........................................

02-456

---

**බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය**

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව කතරගම හින්දු විශ්‍රාම ශාලාවේ භාරකරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට අයත් කතරගම හින්දු විශ්‍රාම ශාලාවේ භාරකරු තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *සේවා කොන්දේසි.-* තෝරාගනු ලබන අපේක්ෂකයා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව සේවයේ III වැනි පන්තියට බඳවා ගනු ලැබේ.

අයදුම්කරු -

III පන්තිය සඳහා පත්කරන ලද දින සිට වසර 3ක ඇතුළත 1වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු ය. II වැනි පන්තිය සඳහා පත්කරන ලද දින සිට වසර 3ක ඇතුළත 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතු ය. I වැනි පන්තිය සඳහා පත්කරන ලද දින සිට වසර 5ක ඇතුළත 3 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතු ය. එසේම 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 පරිදි දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවයක් ලබා ගත යුතුය.

03. *වැටුප් බණ්ඩය හා පරිමාණය :*

(i) වැටුප් බණ්ඩය - MN-1-2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුකූලව.
(ii) වැටුප් පරිමාණය-රු.27,140-10x300-11x350-10x495-10x660-රු.45,540/-.

04. සුදුසුකම් :

4.1 අධ්‍යාපන සුදුසුකම්

(i) අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ/ඉංග්‍රීසි, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සහිතව එක්වරක දී විෂයයන් 06ක් සමත්විය යුතු ය.

හා

(ii) අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් එක් විෂයයක්වත් සමත් විය යුතු ය. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර).

4.2 වෙනත් සුදුසුකම් :

(i) හින්දු ආගම හා සංස්කෘතිය, දේශීය සංස්කෘතිය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය.

(ii) දෙමළ හා සිංහල භාෂා ප්‍රවීණතාවය සැළකිල්ලට ගනු ලැබේ.

4.3 යෝග්‍යතාවය :

(i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
(ii) මනා චරිතයකින් හා ශරීර සෞඛ්‍යය යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
(iii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට (2020.02.29 )වයස අවුරුදු 18ට නොඅඩුවිය යුතු අතර, අවු.30ට වැඩි නොවිය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

05. *අයදුම් කිරීමේ පිළිවෙල :*
මෙම දැන්වීමේ සඳහන් ආකෘතියට අනුව A4(81/2" x 12") ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත් සකස් කර ගත යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය, අධ්‍යක්ෂ, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, අංක 248/1/1, ගාලුපාර, කොළඹ 04 යන ලිපිනයට, 2020.03.01 දා හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම් පත්‍රය බහාලු ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

06. *විභාග ගාස්තුව :*

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, අධ්‍යක්ෂ, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව නමට රු. 500 ක මුදල් සාමාන්‍ය ඇණවුමක් සිදු කර එය අයදුම්පතෙහි අදාළ කොටුවේ ඇලවිය යුතු ය.

07. *තෝරා ගැනීමේ ක්‍රමවේදය :*

7.1 ලිඛිත විභාගය-
මෙය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විතය.
(i) බුද්ධි පරීක්ෂණය - ලකුණු 100 (කාලය පැය 01)
(ii) සාමාන්‍ය පොදු පරීක්ෂණය - ලකුණු 100 (කාලය පැය 01)

මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබේ. සම්මුඛ පරීකෂණය සඳහා කැඳවනු ලබන්නේ ලිඛිත විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40ක් ලබාගත් අයදුම්කරුවන් පමණි.

*විභාගය පැවැත්වෙන දිනය.-* මෙම විභාගය 2020 මාර්තු මස කොළඹ දී පැවැත්වේ.
*විභාග මාධ්‍යය.-* මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

08. විෂයය නිර්දේශය :

(i) සාමාන්‍ය බුද්ධිය - ලකුණු 100 (කාලය පැය 01)
පදගත සංඛ්‍යාත්මක සහ රූපාකර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමන සහ ප්‍රතිචාර පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කරගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

(ii) සාමාන්‍ය දැනුම - ලකුණු 100 (කාලය පැය 01)
1. හින්දු ආගම හා සංස්කෘතිය විෂයයන්
2. සාමාජීය හා සංවර්ධන කටයුතු පිළිබඳව
3. වත්මන් ශ්‍රී ලංකාවේ දේශපාලනික හා ආර්ථික කටයුතු පිළිබඳව
4. සාමාන්‍ය පරිපාලන ක්‍රම හා පාරිභෝගික සත්කාරය පිළිබඳව
5. වර්තමාන ලෝකයේ තොරතුරු පිළිබඳව
6. තොරතුරු තාක්ෂණය

09. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :
තෝරාගනු ලබන අයදුම්කරුවන් සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය අධ්‍යක්ෂ, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබේ. අයදුම්කරු සතු අදාළ විෂය දැනුම, අතිරේක සුදුසුකම් හා වෙනත් සාධනයන් සඳහා ලකුණු ප්‍රදානය කරනු ඇත. සම්මුඛ පරීක්ෂණයේ දී අවම වශයෙන් ලකුණු 40ක් වත් ලබාගත යුතුය.

ඒ. උමාමහේෂ්වරන්,
අධ්‍යක්ෂ.

2020 පෙබරවාරි මස 06 වැනි දින,
හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
248-1/1, ගාලු පාර,
කොළඹ 04.

**කතරගම හින්දු විශ්‍රාම ශාලාවේ භාරකරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා අයදුම් පත්‍රය**

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

1. විභාගය සඳහා භාෂා මාධ්‍යය :

සිංහල - 01
දෙමළ - 02

| |
|---|
| |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2. මුලකුර සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————. මහතා/මහත්මිය/මෙනවිය)

3. සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :————.

5. ස්ථිර ලිපිනය :————.
6. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

7. 7.1 උපන් දිනය :————.

7.2 අයදුම්පත් අවසන් කරන දිනට වයස

අවුරුදු ☐ මාස ☐ දින ☐

8. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ

(0 - ස්ත්‍රී, 1 - පුරුෂ) ☐

9. විවාහක / අවිවාහකභාවය ඃ

(1 - අවිවාහක, 2 - විවාහක) ☐

10. ජන වර්ගය ඃ ☐

(සිංහල-1, දෙමළ-2, , මුස්ලිම්-3, වෙනත්-4)

11. දුරකතන අංකය :————.

12. සුදුසුකම් ඃ

12.1 අ.පො.ස සාමාන්‍ය පෙළ විභාග තොරතුරු ඃ

| අනු අංකය | වර්ෂය | විභාග අංකය | විෂය | ප්‍රතිඵලය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

12.2 *අධ්‍යාපන සුදුසුකම්* : අ.පො.ස උසස් පෙළ විභාග තොරතුරු

| අනු අංකය | වර්ෂය | විභාග අංකය | විෂයය | ප්‍රතිඵලය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

12.3 වෙනත් සුදුසුකම් :.................................................................................................
.................................................................................................

13. ඔබ යම් වරදකට කිසියම් අධිකරණයකින් දඬුවම් ලබා ඇත්ද? :————.
(ඇත්නම් කරුණු දක්වන්න.)

14. විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම පිළිබඳ තොරතුරු :
1. මුදල් ගෙවන ලද තැපැල් කාර්යාලය :————.
2. මුදල් ඇණවුම් අංකය හා දිනය :————.

| |
|---|
| මුදල් ඇණවුම නිසි පරිදි මෙහි අලවන්න.<br>(ඡායා පිටපතක් තමා සතුව තබා ගත යුතුය. |

15. අයදුම්කරුගේ ප්‍රකාශය :
මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. තවද, මා රාජ්‍ය සේවයේ තනතුරකින් පහකරන ලද හෝ තනතුරක් හැරගිය පුද්ගලයෙකු නොවන බව ද ප්‍රකාශ කර සිටිමි. මෙම විභාගය සම්බන්ධයෙන් පවතින නීතිරීති වලට බැඳී සිටීමට හා විභාග නීති රෙගුලාසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනීගියහොත් විභාගය පැවැත්වීමට පෙර, විභාගය පැවැත්වීමේ දී, ඉන්පසු හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීම සඳහා ගනු ලබන ඕනෑම තීරණයකට බැඳී සිටීමට මම එකඟ වෙමි. තව ද, අධ්‍යකෂක, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් පනවනු ලබන නීති හා රෙගුලාසි වලට එකඟ වන අතර, මෙම තනතුරෙහි පත්වීම සහ රාජකාරි ස්ථානය පිළිබඳ සියලු තීරණ ගැනීමේ අයිතිය එම අධ්‍යක්ෂකවරයාට ඇති බවද පිළිගනිමි.

16. රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා පමණයි, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.

මෙම ඉල්ලුම්කරු වන ........................................................................................ මහතා / මහත්මිය / මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ ................................................................................ වශයෙන් ස්ථිර / තාවකාලික නිලධාරියෙක් බව ද, ඔහු / ඇයට මෙම පත්වීමේ රාජකාරිය ඉටු කිරීමට හැකියාව ඇති / නොමැති බවද, සඳහන් කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව

දිනය :————.
නම :————.
තනතුර :————.
අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :————.

02-457

### පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය

### ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ
### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීමේ
### විවෘත සහ සීමිත තරග විභාගය
### Open and Limited Competitive Examination for Recruitment of Officers to Grade III of Sri Lanka Technical Service

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය සඳහා තනතුරු පුරප්පාඩු 28 පිරවීමේ විවෘත සහ සීමිත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය කොළඹ නගරයේ පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානවලදී 2020 ජූනි මාසය තුළ දී පැවැත්වේ.

01. පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | |
|---|---|---|---|
| | | *විවෘත* | *සීමිත* |
| 01. | උද්‍යාන සංවර්ධන සහකාර | 17 | 7 |
| 02. | පර්යේෂණ සහකාර | 02 | - |
| 03. | ශ්‍රව්‍ය දෘෂ්‍ය තාක්ෂණ සහකාර | 01 | - |
| 04. | කාර්මික නිලධාරි (සිවිල්) | 01 | - |

02. *බඳවා ගන්නා ක්‍රමය* :

2.1 ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් බඳවා ගැනීම සඳහාවන ලිඛිත තරග විභාගය.
විභාගය පැවැත්වෙන දිනය - මෙම විභාගය 2020 ජූනි මාසය තුළ පැවැත්වේ. විභාගය පවත්වන දිනය පසුව දැනුම් දෙනු ලැබේ. මෙම විභාගය අවලංගු කිරීමේ හෝ කල් දැමීමේ අයිතිය විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

2.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :
ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු - අපේක්ෂකයින්ගේ තනතුරුවලට අදාළ සුදුසුකම් සනාථ කර ගැනීම. මේ සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

03. 3.1 තෝරා ගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III වන පන්තිය සඳහා බඳවා ගැනේ.

3.2 මෙම තනතුරු ස්ථිරය. (විශ්‍රාම වැටුප් සම්බන්ධව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් වේ.)

3.3 පත්වීම ක්‍රියාත්මක වන දින සිට වසර (3) ක පරිවාස කාලයකට යටත් වේ. පළමු කාර්යක්ෂමතා කඩඉම, පත්වීම ලද දින සිට වසර 3 ක් ඇතුළත සමත් විය යුතු වේ.

3.4 එසේම 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 පරිදි මෙහි දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳ නියමිත ප්‍රවීණතාව ලබා ගත යුතුය. (ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව වේ.)

04. 4.1 වැටුප් කේත අංකය - (MN 3-2016)

4.2 වැටුප් පරිමාණය :
රු.31,040 - 10x445 - 11x660 - 10x730 - 10x750 - රු.57,550/-

05. *වයස් සීමාව* :- (අයදුම්පත් කැඳවන අවසාන දිනයට)
අවම වයස් සීමාව - අවුරුදු 18
උපරිම වයස් සීමාව - අවුරුදු 30
ඒ අනුව 2002.03.13 දින හෝ ඊට පෙර හා 1990.03.13 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

සීමිත අයදුම්කරුවන් සඳහා වයස් සීමාවන් අදාළ නොවේ.

06. *කායික සුදුසුකම්* :- සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

07. *සුදුසුකම්* :

07.1 විවෘත බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් :

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|
| උද්‍යාන සංවර්ධන සහකාර | I. සිංහල/ දෙමළ/ඉංග්‍රීසි/ භාෂාව හා ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (6) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;<br>සහ |
| පර්යේෂණ සහකාර | II. (a) උද්‍යාන සංවර්ධන සහකාර හා පර්යේෂණ සහකාර තනතුරු සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ව විද්‍යාව, ජෛව පද්ධති තාක්ෂණය විෂයයන් දෙකක් ඇතුළුව විද්‍යා විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම (සාමාන්‍ය ඉංග්‍රීසි සහ පොදු පරීක්ෂණය හැර) |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය සහකාර<br><br>කාර්මික නිලධාරි | (b) ශ්‍රව්‍ය දෘෂ්‍ය තාක්ෂණ සහකාර තනතුර සහ කාර්මික නිලධාරි තනතුර සඳහා අ.පො.ස. උ/පෙළ විභාගයේ දී ගණිතය හෝ තාක්ෂණවේදය විෂය ධාරාවේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව ඉංජිනේරු තාක්ෂණ හෝ තොරතුරු තාක්ෂණ ඇතුළුව ගණිතය හෝ තාක්ෂණවේදය විෂයයන් 3 ක් එකවර සමත් වී තිබීම. (සාමාන්‍ය ඉංග්‍රීසි සහ පොදු පරීක්ෂණය හැර) |

07.2 *සීමිත බඳවා ගැනීමේ සුදුසුකම්* :

07.2.1 පළපුරුද්ද-
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තුමේන්තුවේ ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර දෙපාර්තමේන්තු ගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

07.02.2 අධ්‍යාපන සුදුසුකම්-
සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමර්ථය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ.) විභාගය විෂයයන් (08) කින් සමත් වීම.

07.3 විවෘත හා සීමිත බඳවා ගැනීමේ වෘත්තීය සුදුසුකම් :

| *තනතුර* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|
| උද්‍යාන සංවර්ධන සහකාර<br><br>පර්යේෂණ සහකාර | උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ ඇති පුහුණු මධ්‍යස්ථානයක උද්භිද උද්‍යාන අලංකරණය සම්බන්ධ දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>අම්පාර හාඩි කාර්මික ආයතනයේ කෘෂිකර්මය පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>ඇක්වයිනාස් ආයතනයේ කෘෂිකර්මය පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම;<br>*හෝ* |

| තනතුර | වෘත්තීය සුදුසුකම් |
|---|---|
| | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම;<br>*හෝ*<br>රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා NVQ 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;<br>හෝ<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ සහකාර | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>වෘත්තීය පුහුණු අධිකාරිය මගින් පිරිනමනු ලබන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් NVQ 06 මට්ටමේ පරිගණක ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම;<br>*හෝ*<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| කාර්මික නිලධාරි (සිවිල්) | මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්);<br>*හෝ*<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (සිවිල්);<br>*හෝ*<br>අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්);<br>*හෝ*<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්);<br>හෝ<br>රැකියා ක්ෂේත්‍රයේ අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම (සිවිල්);<br>*හෝ*<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

08. *වෙනත් :*

(i). ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(ii). අයදුම්කරුවන් මනා චරිතයකින් යුක්ත විය යුතුය.
(iii). අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට 05 සිට 07.3 දක්වා ඇති සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
(iv). යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි .
(v). සේවයට බඳවා ගැනීම සඳහාවන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට සපුරා තිබේ නම් පමණි.

09. *ලිඛිත විභාගය :*

09.1 මෙම විභාගය විභාග කොමසාරිස්වරයා විසින් පවත්වනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *ප්‍රශ්න පත්‍ර අංකය* | *කාලය* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 1 | පැය 01 | 100 | 40 |
| විෂයානුබද්ධ දැනුම( උද්‍යාන සංවර්ධන සහකාර / පර්යේෂණ සහකාර තනතුර සඳහා) | 2 | පැය 03 | 100 | 40 |
| විෂයානුබද්ධ දැනුම (ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ සහකාර තනතුර සඳහා) | 3 | පැය 03 | 100 | 40 |
| විෂයානුබද්ධ දැනුම (කාර්මික නිලධාරී (සිවිල්) තනතුර සඳහා) | 4 | පැය 03 | 100 | 40 |

***සටහන*** :- සෑම අපේක්ෂකයකුම 1 - බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍රයට හා ප්‍රශ්න පත්‍ර 2,3,4 යන ඒවායින් එකකට ලෙස සම්පූර්ණ ප්‍රශ්න පත්‍ර දෙකකට පෙනී සිටිය යුතුය. මෙම ප්‍රශ්න පත්‍ර දෙකම එකම දිනයක පවත්වනු ලැබේ.

9.2 *විෂය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| උද්‍යාන සංවර්ධන සහකාර<br><br>පර්යේෂණ සහකාර | 1. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා මල් වගා කර්මාන්තයේ දායකත්වය<br>1.1 දළ ජාතික නිෂ්පාදනයට මල් වගා කර්මාන්තයේ දායකත්වය<br>1.2 මල් වගා කර්මාන්තයේ අපනයන හා ආනයන තත්වය<br><br>2. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම<br><br>3. පස හා ශාක පෝෂණය<br>3.1 පසේ ව්‍යුහය , වයනය , භෞතික හා රසායනික ලවණතාවය හා බෝග වගාව කෙරෙහි බලපෑම.<br>3.2 ශාක පෝෂණය , පාංශු ශාක පෝෂණය කළමනාකරණය<br>3.3 පැළෑටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු<br><br>4. එළවළු නිෂ්පාදනය<br>4.1 එළවළු තවාන් පාලනය<br>4.2 එළවළු වර්ග රෝපණ කටයුතු ,අස්වනු නෙලීම හා සැකසීම<br><br>5. මී මැසි පාලනය<br>5.1 ආර්ථික වැදගත්කම<br>5.2 මී මැසි ගෘහ ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම<br>5.3 අස්වනු ලබාගැනීම හා සකස් කිරීම<br><br>6. මල් වගාව<br>6.1 මල් වගා ක්‍රම හා පසු අස්වනු තාක්ෂණය තුළින් නිෂ්පාදන ඉහළ යාම |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| පර්යේෂණ සහකාර | 7. භූමි අලංකරණ ක්‍රම<br>7.1 ඉතිහාසය, උද්‍යාන අලංකරණ මූලධර්ම, උද්‍යාන අලංකරණ අංග හා ශෛලීන්<br>7.2 භූමි සැලසුම්කරණය, මේ හා අදාළ නීති රීති<br>7.3 වෙළඳපොළ සඳහා කැපූ මල්, විසිතුරු පැළ පත්‍රිකා නිෂ්පාදනය හා ඒවා වෙළඳපොළට සකස් කිරීම<br><br>8. ජෛව විවිධත්වය<br>8.1. ජෛව විවිධත්ව සංරක්ෂණය, ශාක හඳුනාගැනීම හා නාමකරණය<br><br>9. පටක රෝපණය<br>9.1. පටක රෝපණයේ මූලික සිද්ධාන්ත පිළිබඳ හා අතීත තොරතුරු පිළිබඳ දැනුම<br>9.2. පටක රෝපණයේ භාවිතයන් /යෙදීම් ,උදාහරණ<br>9.3. පටක රෝපණයේ වාසි /අවාසි<br><br>10. පැළෑටි නිරෝධනය පිළිබඳ දැනුම<br>10.1 පැළෑටි නිරෝධනය රෙගුලාසි පිළිබඳ දැනුම<br>10.2 පැළෑටි නිරෝධන ක්‍රම<br><br>11. ජෛව තාක්ෂණය<br>11.1 DNA වල වැදගත්කම<br>11.2 ජානය යනු කවරක්ද එහි ක්‍රියාකාරිත්වය<br>11.3 ජාන ඉංජිනේරු ශිල්ප ක්‍රම මගින් ශාක වැඩිදියුණු කිරීමට ඇති හැකියාව |
| ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ සහකාර | 1. නිශ්චල හා වීඩියෝ කැමරාවක කොටස් ඒවායේ කාර්යභාරය, හා ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුම<br>2. පරිගණකයක කොටස් එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ මූලික දැනුම<br>3. පරිගණකයක් තුළ ඡායාරූප හා වීඩියෝ පට ගබඩා කිරීම, සකස් කිරීම, සංරක්ෂණය හා වීඩියෝ වැඩසටහන් නිෂ්පාදනය පිළිබඳ මූලික දැනුම හා ඊට අදාළ මෘදුකාංග පිළිබඳ දැනුම<br>4. ඡායාරූපකරණය (Photography) පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික දැනුම<br>5. වීඩියෝකරණය හා එහි මූලධර්ම<br>6. මල්ටි මීඩියා උපකරණයේ කොටස් හා ක්‍රියාකාරී බව<br>7. ශබ්ද වාහිනී උපකරණ පිළිබඳ දැනුම හා පටිගත කිරීම හා ශ්‍රව්‍ය උපකරණ ක්‍රියාත්මක කිරීම හා පාලනය පිළිබඳ දැනුම |
| කාර්මික නිලධාරී | 1. ගෘහ නිර්මාණ ශිල්පීය ඇඳීම්<br>1.1 ව්‍යුහමය ඇඳීම<br>1.2 සවි ගැන්වූ කොන්ක්‍රීට් තහඩු අත්තිවාරම්, යකඩ කාප්ප, කුළුණු ආදියෙහි ව්‍යුහමය ඇඳීම පිළිබඳ දැනුම<br>2. ගොඩනැගිලි ද්‍රව්‍ය පිළිබඳ විස්තර<br>2.1 සිමෙන්ති, හුණු, කොන්ක්‍රීට් ගල්, ගඩොල්, දැව, සක්ක ගල්, තීන්ත හා වාර්නිෂ් වර්ග, ප්ලාස්ටික් හා වීදුරු, ගොඩනැගිලි ඉදි කිරීමේදී ද්‍රව්‍ය වශයෙන් යොදා ගන්නා ආකාරය සහ ඒවායෙහි ප්‍රමිතිය පිළිබඳ දැනුම |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| කාර්මික නිලධාරී | 3. ගොඩනැගිලි පරිමාණ මිනුම් පිළියෙළ කිරීම සහ ඇස්තමේන්තු කිරීම ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීම සහ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි ද්‍රව්‍ය, කම්කරුවන් සංඛ්‍යාව ඇස්තමේන්තු කිරීම<br><br>4. මැනීම සහ මට්ටම ගැනීම<br>4.1 දම්වැල් මිනුම්,මට්ටම් ගැනීම, තියෝඩලයිට් භාවිතය පිළිබඳ සහ තල මේස මැනුම් පිළිබඳ දැනුම<br><br>5. ගොඩනැගිලි ඉදිකිරීම<br>5.1 අත්තිවාරම්, බිත්ති බැඳීම, දැව වහලය, යකඩ කාප්ප, කුළුණු, කොන්ක්‍රීට් කුළුණු, අත්තිවාරම් තට්ටු, තරප්පු, ආදිය යොදනු ලබන ආකාරය සහ යොදනු ලබන අවස්ථා<br><br>6. ව්‍යුහ<br>6.1 ව්‍යාකෘති බල, නම්‍යතා පූර්ණ බල සටහන් ආදිය ගණනය සහ නිර්මාණය<br><br>7. සේවාවන්<br>7.1 විදුලි, ජල, සනීපාරක්ෂක<br><br>8. ආරක්ෂිත ක්‍රම<br>8.1 වැඩපළක තිබිය යුතු ආරක්ෂිත ක්‍රම |

10. ලිඛිත පරික්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරික්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ. ලිඛිත විභාගයෙන් එක් එක් විෂයට ලකුණු 40% කට නොඅඩුව ලබා ගත් අපේක්ෂකයින් ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක නම් ඇතුළත්වන පරිදි සකස් කළ ප්‍රතිඵල ලේඛනය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ලැබේ.

සීමිත තරග විභාගයෙන් බඳවාගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් දෙපාර්තමේන්තුව තුළ නොසිටි නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරග විභාගය මගින් තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ.

10.1 විභාග ප්‍රතිඵල -

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.resultsexams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

11. විභාග කොන්දේසි :

11.1 විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලු ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතු ය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම තමාට නියමිත ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුතුය.

11.2 විභාග ගාස්තු රු. 600.00 කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට හෝ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ ගෙවා අයදුම්කරුවන්ගේ නමින් ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

11.3 විභාග ගාස්තුව සඳහා කිසිම අවස්ථාවක මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද මුදල මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් නොකරන බවද දන්වමි.

සටහන : ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භවන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

11.4 ඉල්ලුම් පත්‍රය සෙ.මී 21-29.7 ප්‍රමාණයේ A4 කඩදාසි සකස් කළයුතු අතර, ශීර්ෂ අංක 01 සිට 03.4 ශීර්ෂ පළමුවන පිටුවටද, 04 සිට ඉදිරියට ඇති ශීර්ෂ පිළිවෙළින් අනෙක් පිටුවලට ද වන ලෙස ගෙන සකස් කළ යුතු බවත්, ඊට අදාළ තොරතුරු විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන්, තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතු වේ. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර හා අසම්පූර්ණ ඉල්ලුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන බැවින්, අයදුම්පත යොමු කිරීමට ප්‍රථම මෙම විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත්, නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පතට අලවා ඇත්ද යන්න පිළිබඳ සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළග තබා ගැනීමටත් විමසිලිමත් වන්න.

11.5 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :

ඉල්ලුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

12.

12.1 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආරක්ෂණ හා විදේශ විභාග) ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පතෙහි පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කර ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

12.2 විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ.එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට /ඇයට සිදුවනු ඇත.

12.3 අපේක්ෂකයාගේ අනන්‍යතාව -

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

12.4 එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය

13. අයදුම්පතේද විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවකුම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. ආයතනයකින් විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු ඔහුගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා ද සහතික කරවා ගත යුතු ය. එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියකු /විශ්‍රාමික ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරිවරයකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

14. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2020.03.13 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කරන්න. ලිපි කවරයේ ඉහළ වම්පස කෙළවරේ අයදුම්කරන තනතුර නම් කර ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යන්න සටහන් කළ යුතුවේ. එක් අයදුම්කරුවකුට අයදුම් කළ හැක්කේ එක තනතුරක් සඳහා පමණි.

අයදුම්පත් යොමු කරන ලිපිනය :

විභාග කොමසාරිස් ජනරාල් ,
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේනම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

16. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින් තීරණය කරනු ඇත.

ආචාර්ය එස්. ඒ. ක්‍රිෂ්ණරාජා,
අධ්‍යක්ෂ ජනරාල්,

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව.
තැ.පෙ. 14,
පේරාදෙණිය

**පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය**

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීමේ

විවෘත සහ සීමිත තරග විභාගය - 2020

Open and Limited Competitive Examination for Recruitment of Officers to Grade III of Sri Lanka Technical Service- 2020

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :

| | |
|---|---|
| සිංහල | -2 |
| දෙමළ | -3 |
| ඉංග්‍රීසි | -4 |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

පෙනී සිටින්නේ විවෘත / සීමිත බඳවාගැනීමට ද යනවග :

| | |
|---|---|
| විවෘත - | 1 |
| සීමිත - | 2 |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

ඉල්ලුම්කරන තනතුර :

| | |
|---|---|
| උද්‍යාන සංවර්ධන සහකාර | -1 |
| පර්යේෂණ සහකාර | -2 |
| ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ සහකාර | -3 |
| කාර්මික නිලධාරී (සිවිල්) | -4 |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
(එක් අයදුම්කරුවකුට අයදුම්කල හැක්කේ එක් තනතුරක් සඳහා පමණි.)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා :- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA )

1.2 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————. (උදා :- GUNAWARDHANA H.M.S.K)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :————.

1.4 ජාතික හැඳුනුම්පත් අංකය

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :————.

2.2 ප්‍රවිශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :

| | |
|---|---|
| ස්ත්‍රී | - 1 |
| පුරුෂ | - 0 |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 උපන් දිනය: වර්ෂය මාසය දිනය

3.3 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු මාස දින

3.4 දුරකථන අංකය :

04. 4.1 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද :————.
4.2 උප දිසාපති / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
4.3 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

05. අධ්‍යාපන සුදුසුකම් ඃ

5.1 අ.පො.ස (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තරඃ

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල ඃ

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තරඃ

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල ඃ

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

06. වෘත්තීය සුදුසුකම් :————.

07. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

(අදාළ කොටුවට (✓) ලකුණ යොදන්න.) ඔව් නම් විස්තරය සඳහන් කරන්න ඃ

ඔව් ☐ නැත ☐

.............................................................................................................................
.............................................................................................................................

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර ඃ

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

09. අයදුම්කරුගේ සහතිකය :-

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් මා දන්නා තරමින් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.
(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවද ප්‍රකාශ කරමි.
(ඇ) තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.
(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය :———— ————,
අයදුම්කරුගේ අත්සන.

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ......................................................මයා./මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද , ඔහු/ඇය මා ඉදිරිපිටදී ....................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද ,එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

දිනය :———— ————.
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

11. සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
(i) තනතුර :————.
(ii) ලිපිනය :————.

————,
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

12. රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා පමණයි.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම්කරු වන ......................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම අමාත්‍යංශයේ/ දෙපාර්තමේන්තුවේ ................................. වශයෙන් ස්ථිර/ තාවකාලික නිලධාරියකු බව ද ඔහුට/ඇයට මෙම පත්වීමේ රාජකාරී ඉටුකිරීමට හැකියාව ඇති / නොමැති බව ද, සඳහන් කරමි. යම් හෙයකින් මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් මෙම අමාත්‍යංශයේ/ දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරෙන් නිදහස් කිරීමට හැකියාව ඇති බව සඳහන් කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

නම :————.

තනතුර :————.
අමාත්‍යංශය/ දෙපාර්තමේන්තුව :————.

02-519

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.